# පොළොන්නරු යුගයේ ආරාමික පොත්ගුල් සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනයක්

බෝදාගම සුමන හිමි

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය පොත් ගුල් ඉතිහාසයේ සංවර්ධිත යුගයක් ලෙස පොළොන්නරු යුගය හැඳින්විය හැකිය. අනුරාධපුර යුගයෙහි අවසන් පරිච්ඡේදයෙහි සිදු වූ විදෙස් ආක්‍රමණ හා අභ්‍යන්තර කල කෝළහල නිසාවෙන් බොහෝ ග්‍රන්ථ සම්භාරයක් විනාශයට පත් වූ අතර පරිහාණියට පත් පොත් ගුල් හා පාරිවේණික ස්ථාන නැවැත පිළිසකර කිරීම හා නව මධ්‍යස්ථාන ගොඩනැංවීම ක්‍රමක්‍රමයෙන් ආරම්භ විය. මේ සඳහා රාජ්‍යානුග්‍රහය ද නොඅඩුව ලැබී ඇති බව වංශකතා තොතුරු මගින් අනාවරණය වේ. පොළොන්නරු රාජධානි යුගය ක්‍රි.ව 1017 - ක්‍රි.ව 1215 දක්වා දශක දෙකකට ආසන්න කාලයක් මෙරටෙහි පරිපාලන මධ්‍යස්ථානය වූ අතර මෙකී කාලපරිච්ඡේදයෙහි රාජ්‍ය අනුග්‍රහය ද ලබමින් මෙරට සාහිත්‍යයෙහි විශාල දියුණුවක් ඇති වූ බව පෙනේ. මෙතෙක් පද්‍ය සාහිත්‍යක් පමණක් පැවැති සිංහල සාහිත්‍යයට ගද්‍ය සාහිත්‍යයක ආරම්භය පොළොන්නරු යුගයේ දී සිදුව ඇත. මෙම යුගයේ දී ආරාමික පුස්තකාල පද්ධතියක් මෙන්ම රාජකීය පුස්තකාල ද ආරම්භ වූ අතර ආරාමික පුස්තකාල වඩාත් සංවර්ධිත වූ බවක් පෙනේ.

## ආරාමික මධ්‍යස්ථාන හා භික්ෂු අධ්‍යාපනය

පොළොන්නරු යුගයේ දී අෂ්ටමූලායතන කේන්ද්‍රව පාරිවේණික අධ්‍යාපනය තව දුරටත් සංවර්ධනය විය. මීට අමතරව අනුරාධපුර යුගයේ දී ආරම්භ කරන ලද දිඹුලාගල අරඤ්ඤායතනය පොළොන්නරු අවධියේ දී වඩාත් සංවර්ධනය වූ අතර **ජේතවනාරාම පිරිවෙන, මහින්දසේන පිරිවෙන, අළාහන පිරිවෙන, චෝළකුලාන්ත පිරිවෙන, රම්භා විහාරය** ආදී අධ්‍යාපනික මධ්‍යස්ථාන මෙම යුගයේ දී අළුතෙන් ආරම්භ කර ඇත. මින් දිඹුලාගල අරඤ්ඤායතනවාසී සඟ පරපුර නිසා මෙරට සාහිත්‍යයෙහි විශාල දියුණුවක් ඇති විය. I වන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකරන ලද ජේතවනාරාම පිරිවෙන දහස් ගණනක භික්ෂූන් ශාස්ත්‍ර අධ්‍යයනය කළ පාරිවේණික මධ්‍යස්ථානයක් විය[1] මෙම පරිවෙණස්ථානයෙහි ප්‍රධානත්‍වය ටීකාචාර්ය සාරිපුත්ත මහා ස්ථවිරයන් දැරූ අතර උන්වහන්සේගේ ශිෂ්‍යයන් වූ සුමංගල, සංඝරක්ඛිත ආදීහූ ද බොහෝ කෘති රචනා කර ඇත. මහින්දසෙන පිරිවෙන ද ප්‍රකට අධ්‍යාපන මධ්‍යස්ථානයක් වූ අතර එහි වාසය කළ ත්‍රිපිටකාචාර්ය වාචිස්සර හිමියන් ප්‍රධාන සඟ පරපුර විසින් ද රචිත කෘති බොහෝය[2] I වන පරාක්‍රමබාහු රජු විසින් ඉදි කරන ලද ආළහාන පිරිවෙන පර්යේෂණය හා විමංසනය සඳහා තිබූ ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානයකි. ගයිගර් මහතා විසින් ද අළාහන පිරිවෙන පර්යේෂණයෙහි නියුක්ත භික්ෂු අධ්‍යාපනික අයතනයක් වන්නට ඇති බවට අදහස් දක්වා ඇත[3] තව ද රුහුණේ පිහිටි රම්භා විහාරය උගත්, සාහිත්‍යධර භික්ෂූන්ගේ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වූ අතර මෙරට සාහිත්‍ය දියුණුවට ඉන් මහත් පිටුබලයක් ලැබී ඇත. මීට අමතරව දිවයින පුරා පිහිටි පිරිවෙන් මගින් මෙරට සාහිත්‍යයෙහි දියුණුවක් මෙන්ම පොත් ගුල්වල සංවර්ධනයක් ද ඇති විය.

අනුරාධපුර යුගයේ මෙන්ම පොළොන්නරු යුගයෙහි ද අධ්‍යාපනයේ පුරෝගාමීත්වය උසුලන ලද්දේ භික්ෂූන් විසිනි. මෙම යුගයෙහි අධ්‍යාපනික මට්ටම අනුරාධපුර යුගයට වඩා සංවර්ධිත වූවකි. සංස්කෘත භාෂාවේ හා මහායාන බුදු දහමේ



ආභාසය මේ සඳහා හේතු වී ඇත. පොළොන්නරු කතිකාවතෙහි... පිරිත් සතර් බණවර් පිරිස් වූවන් මහණ් කරනු ඉසා..." යි දැක්වෙන පරිද්දෙන් සතර බණවර සෑම අධ්‍යාපනික මධ්‍යස්ථානයකම උගන්වන්නට ඇති බව පෙනේ.[4] එසේම ග්‍රන්ථධූර හා විදර්ශනාධූර වශයෙන් භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ග 02 ක් යටතේ ක්‍රියාත්මක වී තිබේ. පොදුවේ හෙරණසිඛ, සේඛියා හා දසධම්ම සූත්‍රය සාමණේරවරුන් විසින් ද, ග්‍රන්ථධූරයෙහි යෙදෙන්නන් විසින් විනය පිටනයෙහි කුදුසිඛ හා ප්‍රාතිමෝක්ෂය ද, විදර්ශනාධූරය වඩන්නවුන් විසින් විනය පිටකයෙහි කුදුසිඛ හා ප්‍රාතිමෝක්ෂය උගත යුතු විය[5] මේ අනුව භික්ෂූන්ගේ අධ්‍යාපනයෙහි විධිමත් සැලස්මක් තිබූ බව පෙනේ.

*වගු අංකː 01*

| ප්‍රවර්ගය | විෂය මාලාව |
|---|---|
| සාමණේරවරු | හෙරණසිඛ, සේඛියා හා දසධම්ම සූත්‍රය |
| ග්‍රන්ථධූර වඩන්නන් | විනය පිටනයෙහි කුදුසිඛ හා ප්‍රාතිමෝක්ෂය |
| විදර්ශනාධූරය වඩන්නන් | විනය පිටනයෙහි කුදුසිඛ හා ප්‍රාතිමෝක්ෂය |
| සමස්ථ භික්ෂූන් උදෙසා | ත්‍රිපිටකය, අටුවා, ව්‍යාඛ්‍යාන, පාලි භාෂාව, සංස්කෘත, විවිධ දර්ශන, වෛද්‍ය විද්‍යාව, ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය |

මේ අනුව පාරිවේණික අධ්‍යාපනයේ විෂයමාලාව සකස්ව තිබූ අතර අධ්‍යාත්ම විද්‍යාව, තර්ක ශාස්ත්‍රය, ශබ්ද විද්‍යාව, වෛද්‍ය විද්‍යාව හා ශිල්ප කර්මාන්තය යන පංචවිද්‍යාවන් ද නිකාය භේදයකින් තොරව ආරාමික අධ්‍යාපනයේ නියුක්ත වූවන් විසින් හදාරා ඇත. භික්ෂූන්ට අමතරව මෙම අධ්‍යාපන ආයතනවලින් රාජවරුන් මෙන්ම විවිධ ගිහි භවතුන් ද අධ්‍යාපනය ලැබූ බවක් වංශකතාවන්හි දැක්වේ.

## ලේඛනයෙන් ඔපවත් වූ පොත්ගුල්

පොළොන්නරු යුගයෙහි ලේඛක පරම්පරාව විසින් මෙරට සාහිත්‍යයෙහි ප්‍රගමනය උදෙසා විශාල මෙහෙයක් සිදු කරන ලදි. ධර්ම හා විනය ග්‍රන්ථ රචනා කිරීම බහුල වශයෙන් සිදු විය. ඉහත දී ද දක්වන ලද අයුරින් පද්‍ය සාහිත්‍යයේ ඇරඹුමත්,

සාහිත්‍යයෙහි විවිධාංග සොයා යෑමත් සිදු වූ කාලපරිච්ඡේදය ලෙස පොළොන්නරු යුගය හැඳින්විය හැකිය. නිකාය සංග්‍රහය නමැති කෘතියෙහි මෙම යුගයෙහි ලේඛනයේ නියුක්ත ලේඛකයන්ගේ නාමාවලියක් ඉදිරිපත් කර ඇත. ඒ මෙසේය.

... අනුරුද්ධය... බුද්ධරක්‍ෂිතය, මෞද්ගල්‍යානය යනා දී වූ ආචාර්ය මහා ස්ථවිරයන් හා එසේ ම එක ශ්‍රැතින් නෙක සහශ්‍ර ග්‍රන්ථ ධාරණයට සමර්ථ වූ වජ්‍රඥාන ඇති ශාරිපුත්‍ර මහා ස්වාමී පාදයන් පටන් සංඝරක්‍ෂිතය, සුමංගලය, වාගීස්වරය, ධර්ම කීර්තිය, නාගසේනය, ආනන්දය... යනාදී මහා ස්ථවිරයෝ නොයෙක් ටීකාර්ථ කථා හා තත් ප්‍රවේශෝපාය වූ අනේක ප්‍රකාර ධර්ම ප්‍රබන්ධ හා සන්න, ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්යප්ති ශාසනය බැබළ වූහ... එසේ ම... රාජ මුරාරිය, ගුරුළු දැමිය, ආගම චක්‍රවර්තිය,... යනාදී වූ ගෘහස්ථ පණ්ඩිත ජනයෝ ධර්මානුගත ශ්ලෝක ප්‍රබන්ධ විචිත්‍රාර්ථ ප්‍රකාශ වූ සන්න ගැටපද හා නොයෙක් ධර්ම ව්‍යාඛ්‍යාන ඉපිද වූහ.[6]"

යනාදී වශයෙන් නිකාය සංග්‍රහයේ දී පොළොන්නරු යුගය බැබළ වූ ගිහි පැවිදි ලේඛකයන් පිළිබඳ දක්වා ඇති තොරතුරු අනුව බොහෝ දෙනෙකු ග්‍රන්ථකරණයේ නියළුණු බව පෙන්. ඉහත තොරතුරුවලට අනුව මෙම යුගයේ දී පමණක් පාරිවේණික පුස්තකාල සුවිශාල පොත් එකතුවකින් සමන්විත වී තිබේ. මෙහි දී එකී පොත් එකතුව පිළිබඳ සංක්‍ෂිප්තව කරුණු දක්වා ඇත.

*වගු අංක 02*[7]

(ටීකා)

| ලේඛකයාගේ නම | රචිත කෘති |
|---|---|
| මහාකාශ්‍යප හිමි[8] | අභිධම්ම සංග්‍රහ පුරාණ ටීකාව, බුද්ධඝෝෂ හිමිගේ මනෝරථපූරණියට සාරාර්ථමංජුසා, පපංචසූදනියට ලීනත්ථප්පකාසිනී, රත්න ශ්‍රී ඥාණයන්ගේ චන්ද්‍රගෝමී ව්‍යාකරණ පඤ්චිකාවට රත්නමතී පඤ්චිකා, පංචිකාලංකාර මංගලාදී ටීකාකරණය |
| සංඝරක්ඛිත හිමි[9] | සුමංගල පසාදිනී ටීකාව (කුද්‍රසික ටීකාව) |
| සුමංගල හිමි[10] | කංඛාවිතරණියට විනයත්ථ මඤ්ජුසා ටීකාව |
| දෙවු වාචිස්සර හිමි[11] | ඛෙමප්පකරණය සහ උත්තරවිනිශ්චය |



| | |
|---|---|
| වාචිස්සර හිමි[12] | නාමරූප පරිච්ඡේද පුරාණ ටීකාව, නාමරූප සමාන පුරාණ ටීකාව, අභිධම්මාවතාර පුරාණ ටීකාව, විනය විනිශ්චය ටීකාව, පටිසම්පදාමග්ගයට ලීනත්ථදීපනී, විසුද්ධිමග්ග සංඛෙප ටීකාව |
| අනුරුද්ධ හිමි[13] | පරමත්ථ විනිච්චයට මුඛමත්ථ ටීකාව |
| බුද්ධරක්‍ෂිත හිමි[14] | ජිනාලංකාර ටීකාව |

| | |
|---|---|
| සන්න | |
| සාරිපුත්ත මහා ස්ථවිර[15] | අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය |
| වාචිස්සර හිමි[16] | සංඛෙප සන්නය |
| පරිකථා | |
| ගුරුළුගෝමී[17] | ධර්මප්‍රදීපිකාව |
| ව්‍යාකරණ | |
| වේදේහ හිමි | සද ලකුණ |
| බුද්ධප්පිය හිමි[18] | රූපසිද්ධි |
| මොග්ගල්ලාන හිමි[19] | මොග්ගල්ලාන ව්‍යාකරණය |
| මහාකාශ්‍යප හිමි[20] | බාලාවබෝධය |
| ඡන්දස් ශාස්ත්‍ර | |
| සංඝරක්ඛිත හිමි | වුත්තෝදය, සුබෝධාලංකාර, සම්බන්ධචින්තාව |

| | |
|---|---|
| කෝෂ | |
| මුගලන් හිමි[21] | අභිධානප්පදීපිකාව |
| ශතක | |
| අනුරුද්ධ හිමි[22] | අනුරුද්ධ ශතකය |
| වංසකථා | |
| දිඹුලාගල මහාකාශ්‍යප හිමි | බුද්ධවංශය, අනාගතවංශය |
| ධර්මකීර්ති මාහිමි[23] | මහාවංශයේ දෙවන භාගය, දාඨාවංශය |
| වාචිස්සර හිමි[24] | පාලි ථූපවංශය |
| ගද්‍ය : බුදු ගුණ වර්ණනා | |
| ගුරුළුගෝමී | අමාවතුර, ධර්මප්‍රදීපිකාව |
| විද්‍යාචක්‍රවර්ති | බුත්සරණ, දම්සරණ, සඟසරණ |
| විනය | |
| සාරිපුත්ත මහාස්ථවිර[25] | විනය සංග්‍රහ |
| මේධංකර හිමි[26] | විනයාර්ථ සමුච්චය |
| පද්‍ය | |
| කර්තෘ අඥාතයි | මුවදෙව්දාවත |
| කර්තෘ අඥාතයි | සසදාවත |
| සංදේශ | |
| නාගසේන හිමි | මනාවුලු සංදේශය |
| පාලි සංදේශ | |
| බුද්ධරක්‍ෂිත හිමි[27] | ජිනාලංකාර කාව්‍යය |
| බුද්ධප්පිය හිමි[28] | පජ්ජමධු කාව්‍යය |

මෙසේ සංක්ෂිප්තව පොළොන්නරු යුගයෙහි ගිහි - පැවිදි ලේඛකයන් විසින් රචිත කෘති පිළිබඳ ප්‍රමාණාත්මක විස්තරයක් දක්වා ඇති අතර මෙමඟින් මෙරට පුස්තකාල සතුව මෙම යුගයේ දී විශාල ග්‍රන්ථ එකතුවක් තිබී ඇත. මීට අමතරව විදේශීය රටවලින් පැමිණි පිරිස් අතුරින් ඡප්පට හිමි 'සංඛේපවණ්ණනා' නමින් අභිධම්මත්ථ සංග්‍රහයට ටීකාවක් ද, රජ මුරාරි නම් පණ්ඩිතයෙක් විසින් මෙරට දී ජාතක ගාථා සන්නය ද, චොළිය කස්සප හිමි සාරත්ථදීපනියේ ඇතැම් කොටස් සඳහා 'විමතිවිනෝදනිය' නම් ටීකාව හා අභිධර්මප්‍රකරණ පොතේ මාතෘකා අනුව යමින් 'මෝහවිච්ඡෙදනීය' ග්‍රන්ථය අටුවාවක් ලෙස ද රචනා කර ඇත. මේ අනුව අනුරාධපුර යුගයේ රචිත ග්‍රන්ථවලින් හා ඉහත දක්වන ලද ග්‍රන්ථ ද ඇතුළත් පොළොන්නරු යුගයේ දී රචිත ග්‍රන්ථවලින් ද, විදේශීය ග්‍රන්ථ සමූහයකින් ද මෙම යුගයෙහි පුස්තකාල පිරී ඉතිරී තිබෙන්නට ඇතිබව පෙනීයයි.

## පොත්ගුල් සංවර්ධනයෙහිලා ලද රාජ්‍යානුග්‍රහය

පොළොන්නරු යුගයෙහි මෙරට රාජ්‍යත්වයට පත් රජවරුන් අතුරින් I වන විජයබාහු (ක්‍රි.ව 1055 - 1110), I වන පරාක්‍රමබාහු (ක්‍රි.ව 1153 - 1186) සහ නිශ්ශංකමල්ල (ක්‍රි.ව 1187 - 1196) යන රජවරුන් විසින් පුස්තකාල ක්ෂේත්‍රයේ සංවර්ධනට ඉමහත් දායකත්වයක් ලබා දෙන ලදහ.

## I වන විජයබාහු රජු

චෝළයන් පරදා රට එක්සේසත් කළ පළමු වන විජයබාහු මෙම යුගයේ රාජ්‍යය පාලනය කළ ශ්‍රේෂ්ඨ රජකෙනෙකි.[29] ද්‍රවිඩ අක්‍රමණ හා යටත් වීම් හේතුවෙන් දේශපාලනික හා සාහිත්‍යමය වශයෙන් විශාල කඩාවැටීමකට ලක්ව තිබූ මෙරටෙහි දේශපාලනික ස්ථාවරත්වයක් හා ආගමික ප්‍රබෝධයක් ඇති කරන ලද්දේ මොහු විසිනි. විශාල භූමි ප්‍රදේශයක් අත්පත් කරගෙන සිටි චෝළයන් පැරදවීම සඳහා යුද කළ මොහු තුන් සිංහලයම එක් සේසත් කළේය.[30] තව ද ශාසනික වශයෙන් පිරිහීමකට ලක් ව



තිබූ මෙරටෙහි උපසම්පදා භික්ෂූන්ගේ අඩුව දැක,[31] බුදු සසුන බබළවනු වස් රාමඤ්ඤ දේශයේ අනුරුද්ධ රජුගේ සහය ඇතිව එරටින් භික්ෂූන් ගෙන්වා උපසම්පදා කර්මයක් ද සිදු කොට ඇත[32] පාලනයට පමණක් නොව ග්‍රන්ථකරණයට දක්ෂ වූ මෙතුමා ලේඛකයන් ග්‍රන්ථකරණය සඳහා යොමු කරමින් ඔවුන් දිරිමත් කළේය.[33] මේ නිසා බොහෝ කෘති රචනා වූ අතර එමඟින් ආරාමික පුස්තකාල පොත පතින් සමෘද්ධිමත් විය. ත්‍රිපිටකය පිටපත් කරවා ආරාමවලට බෙදා දීම මොහු විසින් සිදු කළ බව මහාවංශයෙහි දක්වේ.[34] තව ද ත්‍රිපිටක ග්‍රන්ථ බුරුමයෙන් ගෙන්නවීම[35] මඟින් හා විදේශීය උගත්හු මෙරටට ගෙන්වා ශාස්ත්‍රීය සේවය සඳහා උනන්දු කළ කාලපරිච්ඡේදයක් ලෙස ද මෙම කාලය හැඳින්විය හැකිය.[36]

## I වන පරාක්‍රමබාහු

හෙළ රාජාවලියෙහි අග්‍රගන්‍ය රජ කෙනෙකු ලෙස I වන පරාක්‍රමබාහු රජතුමා හැඳින්විය හැකිය. මෙරට සාහිත්‍යයට අනූපම සේවාවක් සිදු කළ පරාක්‍රමබාහු රජු නිසා පොළොන්නරු යුගයේ ස්වර්ණතම අවධිය ලෙස මේ කාලපරිච්ඡේදය පෙන්වා දිය හැකිය. පළමු වන විජයබාහු රාජුගේ පාලනයෙන් පසුව නැවැත වරක් බුදු සසුනෙහි විශාල පරිහානියක් ඇති විය. දිඹුලාගල කාශ්‍යප හිමියන්ගේ ප්‍රධානත්වයෙන් යුතුව මුළු ලංකාවම අයත් වන පරිදි ශාසන සංශෝධනයක් සිදු කළේය.[37] ශාසන සංශෝධනයෙන් පසුව කතිකාවතක් භික්ෂු සංඝයාගේ සම්මතයෙන් පිහිට වූ අතර එමඟින් භික්ෂු අධ්‍යාපනය හා විනය පිළිබඳ බොහෝ කරුණු ඇතුළත්ය[38] මේ සඳහා පළමු වන පරාක්‍රමබාහු රජු තම දායකත්වය ලබා දුන් අතර ශාසන සංශෝධනය හා කතිකාවත බුදු සසුනේ උන්නතිය සඳහා හේතු විය.

පළමුවන පරාක්‍රමබාහු රජතුමා ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට පුස්තකාලයන්හි දියුණුව පිණිස පුස්තකාල පද්ධතියක් මුළු රට තුළම ස්ථාපනය කළේය. මහාවංශයෙහි අවස්ථා දෙකක දීම පරාක්‍රමබාහු රජුගේ පොත් ගුල් තැනවීම හා ප්‍රතිසංස්කරණය

පිළිබඳ සඳහන් වේ[39] හෙතම පොළොන්නරුවේ පොත්ගුල් 2ක් හා රුහුණේ පොත්ගුල් 128 ක් ගොඩ නැංවූ බව චූලවංශය සඳහන් කරයි. එසේම පිරිවෙන් තුන්සිය හැටක් ද ඉදි කර ඇත[40] ඒ අතර පූර්වාරාමය, දක්ෂිණාරාමය, උත්තරාරාමය, පශ්චිමාරාමය, ජේතවනාරාමය, ලංකාතිලකය හා තිවංකය යන සුප්‍රසිද්ධ පිරිවෙන් ද ඊට අයත්ය. මීට අමතරව ඉතිහාසඥයන් අදහස් පල කරන පරිදි පොළොන්නරුවේ නටඹුන් වී විශාල මන්දිරයක් වැනි ගෘහය (රාජ මාළිගාව අසළ) රාජකීය පුස්තකාලයක නටඹුන් විය හැකි බවයි. මෙම පොත් ගුල් විහාරයවක්‍රාකාර බිත්තියකින් යුතු ගඩොලින් නිම කරන ලද ගොඩනැගිල්ලකි. මෙම විහාරයේ තිබී හමු වූ සෙල්ලිපියක මෙසේ සඳහන් වේ.

''ලංකා ධිනාතෝ සොධිරෝ - ජිණන්නතිං විසොධයි
පඨමකාරී තත්තේන - විහාරං සකලං ඉමං
පරක්කම නරින්දස්ස - මහේසි තස්ස ධීමතො''

මෙයින් ප්‍රකාශ වන්නේ මෙය පැරකුම්බාවන්ගේ නිර්මාණයක් බවයි. පොත් ගුල් වෙහෙර අසල ඇති ගල් තලාව මත නෙලා ඇති ප්‍රතිමාව අත ඇත්තේ පුස්කොළපොතක් විය හැකි යයි ඉතිහාස විද්‍යාඥයින්ගේ මතයයි. තවත් අය මෙය ඍෂිවරයෙකුගේ ප්‍රතිමාවක් ලෙසද හඳුන්වයි. මීට අමතරව පරාක්‍රම බාහු රජතුමා විසින් ඉදි කරන ලද සෑම සංඝාරාමයක පොත්ගුල් 2ක් තිබූ බව චූල වංශයේ' සඳහන් වේ. මෙම පරාක්‍රමබාහු රජතුමාගේ කාලය තුළදී බුරුමයේ හා ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් බෞද්ධ ග්‍රන්ථයන් සොයා බොහෝ පිරිස් ශ්‍රී ලංකාවට පැමිණියහ.

## නිශ්ශංකමල්ල රජු

පොළොන්නරුව රාජධානිය කරගත් නිශ්ශංකමල්ල රජුගේ කාලය ද ලේඛන කලාව සම්බන්ධව ඉතා වැදගත් කාල පරිච්ඡේදයකි. නිශ්ශංකමල්ල රජතුමා විසින් භාවිත කරන ලද ඉතා වැදගත් ලිපි ලේඛන හා තඹපත් මත හසුන් ලිවීමට කටයුතු



කර තිබීම ඊට හේතුවයි. විශේෂ වශයෙන්ම විවිධ පරිත්‍යාග සම්බන්ධව තඹපත් භාවිත කර ඇති අතර එකී ප්‍රදානයන් පිළිබඳ චූලවංශයෙහි මෙසේ දක්වා ඇත.

''දස්කම් කළ චූන ට දෙන හිරසන්ද
පමුණුවෙයන් මීයන් කන පනැලියා දියෙහි හිරි
සේ අස්ථිර නොකොට පස්වා දහසකට පවත්නා
පරිද්දෙන් තාමු සාසන ලංකාවේ පවත් කොට
එසේම ලේඛණ කලාව දියුණු කරලීමේ
අරමුණින් විවිධ ලේඛණයන්ට විවිධ උපාධි නාම
පරිත්‍යාග කරන ලදි''

යනුවෙන් දක්වා ඇති අතර මෙයින් ලේඛනයේ යෙදෙන්නවුන් සඳහා උපාධි නාම ලබාදෙමින් ඔවුන් දිරිමත් කළ බවක් දක්වා ඇත.

මෙහි දී පොළොන්නරු යුගයේ දී රාජසභාවේ අනුමැතියෙන් ලේඛකයන් සඳහා වාගීශ්වර, කවි චක්‍රවර්ති, සරස්වතී, විද්‍යාපති, කලිකාල, සර්වඥ, කවිරාජ, පණ්ඩිත,[41] විද්‍යා චක්‍රවර්ති,[42] මහේෂ්වරාචාර්ය, මහාපාත්‍ර වැනි නම්බු නාම ප්‍රදානය කරන ලදි. බුත්සරණ නම් මහානර්ඝ කෘතිය ලියා ඇත්තේ එසේ විරුද ලැබූ ලේඛකයෙක් විසිනි.[43] එසේම පළමු වන පරාක්‍රමබාහු රජු හා දෙවන විජයබාහු රජු **පණ්ඩිත** යන උපාධි නාමයෙන් පිදුම් ලබා ඇත.

එසේද ලීලාවතී රැජින ද ග්‍රන්ථකරණය සඳහා ලබා දුන් දායකත්වයක් පිළිබඳ සසඳාවතෙහි මෙසේ දැක්වේ.

***"කළ ලෝ සසුන් වැඩ - ලීලාවතී හිමි සඳ***
***පළ කළ දම් රජ සිරි - මෙ වැටුම් හි පිටු බල වී"***

යනුවෙන් දැක්වෙන අතර එමඟින් ලේඛනය සඳහා ලීලාවතී රැජින ලේඛකයන්ට අනුග්‍රහය දක්වා ඇත.[44]

පොළොන්නරු යුගයේ 'පොත්වරුන්' යන නාමයෙන් හඳුන්වන පිරිසක් සිට ඇති අතර මොවුන් මෙකල පොත්පත්

ආරක්ෂා කළ විශේෂ නිළදාරීන් පිරිසක් වන්නට ඇත. පොත් වරුන් යන නාමයෙන් හැඳින්වුණ මොවුහු එකළ සිටි පුස්තකාල භාරකරුන් විය හැකිය. මොවුන් මේ සඳහා යොමු කර ඇත්තේ රජවරුන් වන අතර පුස්තකාල ඉතිහාසයේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස මෙය හැඳින්විය හැකිය. මේ අනුව පළමු වරට පුස්තකාල වෘත්තීයක් ලෙස ක්‍රියාත්මක වූ යුගය ලෙස ද පොළොන්නරු යුගය හැඳින්වේ.

## රාජකීය පොත්ගුල්

පොළොන්නරු යුගයේ තිබූ පුස්තකාල අතර රාජකීය පොත් ගුල් සඳහා සුවිශේෂීත්වයක් හිමි වේ. රාජකීය පොත් ගුලක් යනු රාජ මන්දිරයේ ස්ථාපිත කරන ලද පොත් ගෘහයක් වන අතර මෙහි එකළ තිබූ ග්‍රන්ථ හා රාජ්‍ය ලේඛනාදියෙන් සමන්විත වූවක් විය හැකිය. ගම්වර පිදීම්, විහාරාරාම පිළිගැන්වීම්, රාජ නියෝග, පිං පොත් මෙහි අන්තර්ගත සුවිශේෂී ග්‍රන්ථ එකතුවක් වන අතර මෙකී කෘති රජවරුන් විසින් නිරන්තරයෙන් පරිහරණය කරන්නට ඇති බවට අනුමාන කළ හැකිය. පළමු වන විජයබාහු හා පළමු පරක්‍රමබාහු රජ කාලයේ දී මෙම පුස්තකාල ප්‍රවර්ගය සංවර්ධිතව තිබූ බවට මහාංවංශයේහි එන ඇතැම් විස්තරයන් මඟින් අනාවරණය වේ.[45]

මේ අනුව පොළොන්නරු යුගයේ රාජ්‍යය පාලනයේ යෙදුණු I වන විජයබාහු (ක්‍රි.ව 1055 - 1110), I වන පරාක්‍රමබාහු (ක්‍රි.ව 1153 - 1186) සහ නිශ්ශංකමල්ල (ක්‍රි.ව 1187 - 1196) යන රජවරුන් ද ලීලාවතී රැජිණිය ප්‍රධාන රාෂ්ට පාලකයන් විසින් මෙරටට ලේඛනයට හා සාහිත්‍යයෙහි ප්‍රගමනයට හේතු වන්නාවූ සංසිද්ධීන් සඳහා තම දායකත්වය නොඅඩුව ලබා දී ඇති අතර එමඟින් පොත් ඉතිහාසයේ දියුණුවක් මෙම කාලපරිච්ඡේදයේ දී දක ගත හැකිය.



## පොළොන්නරු යුගයේ පුස්තකාල සම්ප්‍රදායේ පරිහානික අවස්ථා

පොළොන්නරු යුගයෙහි පොත් ගුල් සම්ප්‍රදායේ පරිහානිය සඳහා නොයෙකුත් කරුණු හේතු විය. ඒ අතරින් ප්‍රධානව හඳුනාගත හැකි ප්‍රධාන සිද්ධීන් මෙසේ දක්විය හැකිය.

එනම්

1. ද්‍රවිඩ ආක්‍රමණ
2. දීර්ඝව රට පාලනය කළ පාලකයන්ගේ අඩුව
3. වෙනත් විදේශීය ආක්‍රමණ
4. දේශපාලනික අස්ථාවරත්වය
5. පාලකයන්ගේ අනුග්‍රහය අඩුවීම

යන ප්‍රධාන සිද්ධීන් නිසාවෙන් මෙම ක්ෂේත්‍රයේ යම් යම් පරිහානික අවස්ථා දක ගත හැකිය. ද්‍රවිඩ ආක්‍රමණ හා වෙනත් විදේශීය ආක්‍රමණවලට වැඩි වශයෙන් ලක් වූ යුගයක් ලෙස පොළොන්නරු යුගය හැඳින්විය හැකිය. කාලිංග මාඝ ආක්‍රමණය මෙරට සෑම පැතිකඩකම පාරිහානිය උදාකරන්නක් විය. එසේම කාලිංඝ මාඝ ආක්‍රමණය පොළොන්නරු රාජධානිය බිඳවැටීමට හේතු වූ අතර මොවුන් විසින් සිදු කළ විනාශයේ යථා ස්වරූපය මහා වංශයෙහි මෙසේ සඳහන් කර ඇත.

> "බොහෝ ලංකාවාසීන්ගේ වස්ත්‍රාභරණාදිය පමණක් නොව ඔවුන් සතු හැම දෙයම පැහැර ගත්හ. ඔවුහු ධනවතුන් පිළියෙන් බැඳ වධ කොට ධනය කොල්ල කෑහ. ප්‍රතිමා ගෘහ කඩා දැමූහ. බොහෝ චෛත්‍ය විනාශ කළහ. ඔවුහු එම ස්ථාන තම වාසස්ථාන කර ගත්හ. **ඔවුහු ප්‍රශස්ථ පොත් බැඳ තිබුණ ලනුවෙන් මුදා ඒ ඒ තැන විසිර වූහ.** අහෝ ඛේදයකි, මාර යෝධයන් වැනි වූ ඒ ද්‍රවිඩ යෝධයෝ රාජ්‍ය ද බුද්ධ ශාසනයද විනාශ කළෝය."

(චූල වංශය)

*යනුවෙන් දක්වා ඇති අතර ඔවුහු ප්‍රශස්ථ පොත් බැඳ තිබුණ ලනුවෙන් මුදා ඒ ඒ තැන විසිර වූහ.*[46]

යන සඳහන් කිරීමට අනුව කාලිංග මාඝ ආක්‍රමණය නිසාවෙන් මෙරට පුස්තකාලයන්හි තිබූ බොහෝ පොත් විනාශභාවයට පත් කළ බව පෙනේ. මෙම විනාශය ලාංකීය පොත් ගුල් කලාවේ එක් අඳුරු කාලපරිච්ඡේදයක් ලෙස හැඳින්විය හැකිය. එසේම පළමු පරාක්‍රමබාහු රජුගෙන් පසු නිශ්ශංකමල්ල රජතුමා හැරෙන්නට වෙන කිසිඳු රාජ්‍ය පාලකයෙකු දීර්ඝ කාලීනව රාජ්‍යත්වය හොබවන්නට අසමත් විය. මේ සඳහා අභ්‍යන්තර දේශපාලනික වියවුල් බව හා විදෙස් ආක්‍රමණ හේතු විය. ඉහතින් දක්වන ලද ප්‍රධාන හේතූන් නිසා පොළොන්නරු රාජධානිය කෙටි කලකින්ම බිඳවැටීමට ලක් වූ අතර පුස්තකාල සම්ප්‍රදාය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ලේඛකයන් අධෛර්යමත් වීම, ලේඛන මාධ්‍ය විනාශ වීම, පොත් ගුල් විනාශයට පත්වීම් ආදී බොහෝ විනාශයන් සිදුව ඇති බව පෙනේ.

## ආන්තික සටහන්

1. මවං. 78: 32 - 49.
2. ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, පි. 92.
3. මලස. පි. 281 - 282.
4. Ez. Vol. II. No. 16. 97p.
5 Ez. Vol. II. No. 265p.
6. නිසං. පි. 24.
7. රණසිංහ, ආර්. ඩී. අයි. එස් (2006), පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය, මහරගම, තරංජි ප්‍රින්ටර්ස්. පි. 165 - 181.
8. මලලසේකර, ගුණපාල (1965), ලංකා පාලි සාහිත්‍යය, කොළඹ: ගොඩගේ. පි. 140 - 144.
9. ශාසනවංශ ප්‍රදීපය. පි. 176.
10. මලලසේකර, ගුණපාල (1965), ලංකා පාලි සාහිත්‍යය, කොළඹ: ගොඩගේ. පි. 148.



11. -එම - පි. 149.
12. -එම - පි. 150.
13. -එම - පි. 161.
14. -එම - පි. 76.
15. -එම - පි. 130.
16. -එම - පි. 141.
17. -එම - පි. 114.
18. ශාසන වංස ප්‍රදීපය. පි. 179.
19. සන්නස්ගල, පු.විබණ්ඩාර (1994), සිංහල සාහිත්‍ය වංශය, කොළඹ, සංස්කෘතික දෙපාර්තුමෙන්තුව. පි. 104.
20. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1948), ථෙරවාදී බෞද්ධචාර්යයෝ, අම්බලන්ගොඩ, එස්. කේ. චන්ද්‍රතිලක. පි. 76.
21. මලලසේකර, ගුණපාල (1965), ලංකා පාලි සාහිත්‍යය, කොළඹ: ගොඩගේ. පි. 139.
22. මලලසේකර, ගුණපාල (1965), ලංකා පාලි සාහිත්‍යය, කොළඹ: ගොඩගේ. පි. 123 - 124.
23. ශාසන වංස ප්‍රදීපය. පි. 150 - 151.
24. මලලසේකර, ගුණපාල (1965), ලංකා පාලි සාහිත්‍යය, කොළඹ: ගොඩගේ. පි. 150 -151.
25. ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, පි. 78.
26. මලලසේකර, ගුණපාල (1965), ලංකා පාලි සාහිත්‍යය, කොළඹ: ගොඩගේ. පි. 149 - 150.
27. ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, පි. 110 - 111.
28. මලලසේකර, ගුණපාල (1965), ලංකා පාලි සාහිත්‍යය, කොළඹ: ගොඩගේ. පි. 165.
29. මහාවංශය (1995), පරි. සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත හිමි, බටුවන්තුඩුවේ, කොළඹ, ගොඩගේ. පරිච්ඡේද 78 : ගාථා. 810.
30. රාජාවලිය, පි. 201.
"ලක්දිව උන් දෙමළුන් මරා ලුහුබඳවා තුන් රාජ්ජය එක්සත් කොට....."
31. රාජාවලිය, පි. 201.
32. රාජාවලිය, පි. 201 : මව. 60: 4-8.
33. මවං. 60 : 75 - 77.
34. මවං. 60 : 22 - 23.

35. නිසං. පි. 20.
36. මව. 60: 8.
37. මව. 78: 8 - 10.
38. Ez. Vol. II. pp. 263 - 268.
39. මව. 78: 36 - 37 : 79 : 82..
40. මහාවංශය (1995), පරි. සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත හිමි, බටුවන්තුඩුවේ, කොළඹ, ගොඩගේ. පරිච්ඡේද 78 : ගාථා. 4953.
41. සිංසාව : පි. 87.
42. සිංසාව : පි. 165.
43. රණසිංහ, ආර්. එච්. අයි. එස් (2006), "පැරණි ලංකාවේ පොත් ගුල් සම්ප්‍රදාය", කර්තෘ, කොළඹ. පි. 140.
44. සඳාවත : 14 ගීතය.
45. මවං. පරි. 64 : ගාථා. 2 - 15.
46. මවං. 80: 67.

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය


1. දීපවංශය (1959), අනු. කිරිඇල්ලේ ඥානවිමල හිමි, ගුණසේන, කොළඹ.
2. මහාවංශය (1996), අනු. ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ඛිත හිමි, ගොඩගේ, කොළඹ.
3. පූජාවලිය (1959), අනු. කිරිඇල්ලේ ඥානවිමල හිමි, ගුණසේන, කොළඹ.
4. අත්වනගලු විහාර වංශය (1898), සංස්. තංගල්ලේ පීනරතනතිස්ස හිමි, ඩීං සී. ඇස්. ජයසූරිය, කොළඹ.
5. නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය (1988) සංස්. ගුණවර්ධන නානායක්කාර, ගුණසේන, කොළඹ.
6. රාජරත්නාකරය (1995), සංස්. කරුණාදාස රූපසිංහ, ගොඩගේ, කොළඹ.
7. රාජාවලිය (1976) සංස්. ඒ. වී සුරවීර, ලේක් හවුස්, කොළඹ.





8. චීන තෙරුන්ගේ ගමන් විස්තර හා හියුංසියං භ්‍රමණ වෘත්තාන්තය (1961), අනු. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ගුණසේන, කොළඹ.
9. බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව (1960), අනු. බලගල්ලේ විමලබුද්ධි හිමි, ගුණසේන, කොළඹ.
10. අපේ සංස්කෘතික උරුමය (1995), සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.
11. අනුරාධ පුර යුගය (1987), සංස්. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන, ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ
12. අබේරත්න, කේ. එම් (1989), විසුද්ධි මාර්ගයෙන් හෙළිවන අධ්‍යාපන සංකල්ප, ගොඩගේ, කොළඹ.
13. අබේසිංහ, වික්‍රමනායක (1999), පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව.
14. අදිකාරම්, ඊ. ඩබ්ලිව් (1969), පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, ජයවර්ධන සහ සමාගම, කොළඹ.
15. අදිකාරි, අබයරත්න (2002), ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන, තිවිර ප්‍රකාශන, නුගේගොඩ.
16. අදිකාරි, අබයරත්න (2002), ශ්‍රී භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති, ගොඩගේ, කොළඹ.
17. අමරවංශ හිමි, කොත්මලේ (1969), ලක්දිව සෙල්ලිපි, ගුණසේන, කොළඹ.
18. ගුණවර්ධන බණ්ඩා, ආර්. පී (2002), මාතලේ අලුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ නොකළ වගයි. කර්තෘ ප්‍රකාශන, උස්සාපිටිය.
19. පියරතන හිමි, ලැඟුම්දෙණියේ (2014), "ශ්‍රී ලංකාවේ ආරාමික පුස්තකාල ඉතිහාසය" ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය, (සංස්.) ලැඟම්දෙණියේ පියරතන හිමි, ඩබ්ලිව්. ඒ. වීරසූරිය සහ ආර්. ඩී. ආනන්ද තිස්ස කුමාර, පියදාස රණසිංහ පදනම, රාගම. පි. 99-112

20. පඤ්ඤාලෝක හිමි, මීගොඩ (2002), ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, ගොඩගේ, කොළඹ.

21. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1948) ථෙරවාදී බෞද්ධාචාර්යයෝ, එස්. කේ. චන්ද්‍රතිලක, අම්බලන්ගොඩ.

22. ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ (1992), "ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය" සංස්. කුඹුරුගමුවේ වජිර හිමි, ඩබ්ලිව්. ජ්. වීරරත්න සහ සනත් නානායක්කාර, බුද්ධශාසන අමාත්‍යාංශය, කොළඹ. පි. 134-157

23. ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ (1995), පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය.

24. රණසිංහ, ආර්. එච්. අයි. එස් (2006), කතෘ ප්‍රකාශන, කැලණිය.

25. රෝහණදීර, මැන්දිස් (1998), නිශ්ශංකමල්ල : පොළොන්නරු යුගය, කර්තෘ ප්‍රකාශන, බත්තරමුල්ල.

26. වික්‍රමසිංහ, කේ.ඩී.පී (1994), සිංහල ලේඛක පරපුර. සංස්.2, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ.

27. විජයසූරිය, විමල (1992), අනුරාධපුර යුගයේ විශ්ව කීර්තිමත් සිංහල මහා ලේඛකයෝ, ගොඩගේ, කොළඹ.

28. වීරසිංහ, කේ. එම්. එම්. කේ (2001), පුස්තකාල ඉතිහාසය, කර්තෘ ප්‍රකාශන, කැලණිය.

29. සිරි තිලකසිරි (2004), සාහිත්‍ය අටුවාව : කුරුණෑගල සාහිත්‍යය, ගොඩගේ, කොළඹ.

30. සුමනජෝති හිමි, දෙගම්මැද (1961), දඹදෙණි යුගය, ගුණසේන, කොළඹ.